


# පහන් වැට

## කවි ලාබයි

අකුරු නැති කවක්
සිරව ඇත
වම් කර්ණිකාවේ
සැතකින් පලා හද
එළියට ගෙන ඒ කව
විකුණා*
ලොකු ගෙයක්
ගමු සොඳුර

## උඩ සහ යට

ඇඳ උඩ *
ගෙරවිලි සමග
සුබ සිහින
ඇඳ යට *
දැල් වියති
බඩගිනිකාර
මකුළුවන්

**තරංග ජයසේන**

පියෙන් පිය සිඟිති පා නගන විට
පිටුපසින් නොසෙල් වී හිඳින්නැති
ඇද වැටෙන්නට නොදී හැම විටම
කෙළින් යන හරි විදිය කියන්නැති

ස්වප්නයක් නොවේ නුඹ කිසි විටෙක
එකම එක මහගු ආදරය මිස
මිය නොයන කිසි දිනෙක මිය නොයන
වියපත්වු ළය මඬල නිදන් වුණා

මඟුල් මුද්දට හිරව දුක් වින්ද
තටු බිඳුණ කිරිල්ලක තටු අතර
උණුහුමට උස් මහත් උනෙමි මම
තැබූ පියවර බොහෝ දුර වැඩිය

ඉතිං මට
හැරෙන්නට නොහැක ආපසු බලා
බලාගෙන සිටියාට එන තුරා
පව්කාර කමෙක මහ බර දැනේ
කාලකණ්ණිම කමෙක දුක දැනේ

ජීවිතය කුමක්දැයි සිතන්නෙමි
අහිමි කරගත් බවක් හඟින්නෙමි

සුභද්‍රා ජයසුන්දර

## සුබ උපන්දිනක් අයියේ......

කර බදා
හඬ නගා
පතන්නට
ළඟ නැතත් නුඹ

කොතැන මුත් නුඹ
මෙතැන මුත් අප
හමුවෙමු සිතින්වත් අද

සිඹින්නට ඔබ දෙකොපුල්
පතන්නට සුබ උපන්දිනයක්
ලැබේවා අපට
ලබන වසරේදීවත්

ආදර අයියේ ඔබට..............

මැයි 9 දාට යෙදෙන
අතුරුදන් වූ අපේ එකම ආදර සො-
යුරු
ප්‍රසන්න වෙත්තසිංහගේ උපන්දිනය
වෙනුවෙන්

ප්‍රසාදිනී වෙත්තසිංහ
වාසනා වෙත්තසිංහ
මිල්පාක් සිට

## සන්නසට සුබාසිරි

මව්පිය,සහෝදර,මේ සැමගෙන් වෙන්ව,
දුර රටකට වෙලා තනිකම දැනෙන විට
සන්නස, සෙනෙහසින් අපගේ ළඟට පැන,
තනිකම දුරුකළා, කවිසිත පුබුදු කර

ඉඳහිට ලියන කවියක් එහි දකිනවිට....
තව තව ලියන්නට සිතුවිලි ගෙනෙනවිට
සතුටට මිසක පාලුවකට ඉඩ කොහිද?

ලෝකයෙ දසඅතේ ජීවත් වන අපට
සෙනෙහස පුරාගෙන මේ ලෙස හැම මසම
ලෝකය පවතිනා තුරු නිති වැජඹෙන්න
සන්නස නුඹට ආසිරි හදපතුලෙන්ම

අසෝකා දේවසුරේන්ද්‍රා
ලෝරියන්ට් - ප්‍රංශය

# විදර්ශනා

වදන් වලින් එහා පිපුණු
සමන් පිච්ච මල් යායේ
පාවී පාවී ඉගිළී
බාල් රඟත් සමනළයෝ
ඉගිළී පාවී පාවී
සිනහ කැකුළු මල් පීදී

නිල් කෙහෙරැළි - ඇඟිළි අගින්
ගලයි සෙමෙන්
පවන් සළන අතර තුරේ
ළමැද මැදින්
ඉඳුන් නිදන්

ළංවී ළංවී ළමැදට
හැංගී හැංගී නොපෙනී
මහද මැදුර පුරා ඇවිද
අඳුරු සිදුරු මුළු හැමෙකෙම
හැංගුන අඟනක ඇත්දැයි
විමසන්නිය දෙනෙත වසන්
ඉව නොවසන්

සැළෙයි ඇහඳ චකිතව වත
මා නිහඬයි - නිසලයි බෝ
මා ඇගෙමද
දෙනෙතින් විමසයි
වදනක් නොදොඩයි
කන් දෙයි
පිළිතුරු සුසුමට
ඉන් සැනසී
දැන් හිනැහෙයි
හිනැහී නැළවී
ළමැදට ළංවෙයි
ළංවෙයි තව තව
ළමැද මැදට

කෙහෙරැළි අතැඟිළි අතරින්
රැළි නංවා රැළි හංගා
ගලයි සෙමෙන්
සෙමෙන් සෙමෙන්....

දයා දියෙන් තෙමා මහද
සෙමෙන් වැසුණු දෙනයන නිල්
නුරා එසකි කැන්දාගෙන
සෙමෙන් විවර විය මිණි කැට

ඉර නැග එන අරුණෝදය
පිපි සඳ මල මිළාන වී
රත් දම් නිල් ආකාසේ
බවුන් වඩන සිත් පාවේ

උදය මවක
සවස දුවක
රැය අඟනක
වෙස් ගැන්වෙන
ඇස් බැන්ඳුම
මන බන්දන

* * *

හිරු නැග විත්
හිරු බැස යයි
සඳ නැග විත්
සඳ බැස යයි
පසළොස්වක පසුකර ගොස්
අමාවකේ සඳ හැංගෙයි




වස්සානය ඉඩෝරයට
ඉඩෝරයෙන් ඉඩෝරයට
ඉඩෝරයෙන් වස්සානෙට
වස්සානෙන් වස්සානෙට
එන යන - යන එන ගානට
අතීතයේ කොළ ගැළවී
ඈතින් ඈතට පාවෙයි

සියොතුනගේ සංද්වනියෙ
කාලය අල්ලන තාළෙට
ඟංගාවේ ගී තනුවට
මා හද ස්පන්දන වේ

පිදුරු සෙවිළි කළ පැල්පත
අතුර පැදුර මත මතුරන
සොඳුරිය කොඳුරන ගීතය
අරුණෝදයෙ එළිපත්තෙත්
සංසාරේ සාංචාරෙට
නිරන්තරේ හුස්ම පිඹියි

මව් පරදන මව් සෙනෙහස
උදේ රැයින් කැන්දා ගෙන
සුළඟට සිළ නිමෙන්න පෙර
පරිස්සමෙන් රැක ගත් යුරු
මව් තුරුළේ දරු සෙනෙහස
දෙවෙනි වරට ලද ගානය

තිවංක රුව
උළු අස්සට
පොරොත්තු ඇස්
කඩුල්ල පැන
ඇඟිළි ගණින වාර ගාන
කල්පය නැවැතුනු ගානය

දුවක නොවන දුවකය ඇය
දුවන නයන මදෙසම ඇස
ළැම පුරවා හළ සුසුමින්
ඇය ඇඟ ලේ ඉනු ගාණය

දිවි දෙවෙනිව මදිවි රකින
හිරු දෙවි වැනි ම'ළඳ එසඳ
නිහඬ නිසල මහද සසල
නොකර සෙමෙන් පවන් සළන

හිස් අහසක තනිව ඔහේ
පාවී ආ ගන්ධබ්බයෝ
ගර්භාසෙක පිළිසිඳගෙන
දකින අසන දැනෙන හැඟෙන
හැම දෙයක්ම - හැම එකක්ම
එකතු කරන් - පොදි බැඳගෙන
කර දඬු හෙම
ලොකු කරගෙන
සංසාරේ සුපුරුදු තනිකම
තනිකර කරකාර බඳිති

දෙපත් රෑන විළි අසිරිය
ඉක්මෙන්නට පෙර ඉක්මන්
වී තුන්පත් රෑන වෙන්න
තතනන රෑ තුන්යාමයෙ
සීන මැදින් - ගැයෙන ගීත
හඬ අසමින්
හිස් අහසේ අයාළෙ යන
අනාත වූ ගන්ධබ්බෙක්
සුජාත වන්නට නැවතත්
පිළිසිඳ ගයි
ගර්බාසෙක
බෝම අඳුරු

ලප් - ඩප්
ලප් - ඩප් ඩප් ඩප්
ලප් - ඩප්
ලප් - ඩප් ඩප් ඩප්

(විරාමය)

**සාමන්ත තැන්නගේ**
saamantha.tennege@gmail.com